## තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**MODEL PAPER**

**රූපලාවන්‍ය ශිල්පය - ජාතික වෘත්තීය සුදුසුකම - 4 වන මට්ටම**

**කාලය - පැය 02**

**විභාග අපේක්ෂකයන් හට උපදෙස්**

- A, B සහ C යන කොටස් තුනෙහි සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සැපයිය යුතුය.
- මෙම ප්‍රශ්ණ පත්‍රයෙහි බහුවරණ ප්‍රශ්ණ, කෙටි පිළිතුරු සහිත ප්‍රශ්ණ සහ ගැලපීමේ ප්‍රශ්ණ ද අඩංගුවේ.
- A කොටසෙහි සෑම ප්‍රශ්ණයකදීම දී ඇති පිළිතුරු හතර අතරින් වඩාත් ගැලෙපන පිළිතුර තෝරා, සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ඊට අදාල අංකය අයත් කොටුව තුල කතිරය (X) සලකුණු කරන්න.
- A, සහ B යන කොටස් දෙකටම මෙම ප්‍රශ්ණ පත්‍රයෙහිම පිළිතුරු ලියන්න.
- මෙම ප්‍රශ්ණ පත්‍රයෙහි පිටු 10ක් අඩංගුවේ.

---

### A කොටස (එක් ප්‍රශ්නයකට ලකුණු 1.5 බැගින්)

1. රූපලාවන්‍යගාර වල සිදුවිය හැකි දුර්වලතාවයන් සඳහා හේතු වන්නේ, එහි පරිපාලනයේ

   a) පළපුරුද්ද නොමැති බව
   b) සහයෝගීතාවය නොමැති බව
   c) කාර්යක්ෂමතාව නොමැති බව
   d) පුහුණුව නොමැති බව

2. රූපලාවන්‍යාගාර වල සිදු කරන සේවාවන් භාර ගන්නාපොතෙහි (Appointment Book) අවශ්‍යතාවය වන්නේ

   a) පාරිභෝගිකයා අපහසුතාවයට පත් කිරීම
   b) අමුද්‍රව්‍ය ඇනවුම් කිරීම
   c) පාරිභෝගිකයාට වේලාව වෙන් කරවා ගැනීම
   d) විලාසිතාවන් තීරණය කිරීම

3. කිසියම් වූ පැමිණිල්ලක් දුරකථනය හරහා විසඳීමේදී වැදගත් වන්නේ, උපායශීලීවීම, ආචාරශීවීම සහ
   a) කලහකාරී වීම
   b) තමන්ව පාලනය කර ගැනීම
   c) බාධාවීම්
   d) නොඉවසිලිමත්වීම

4. රූපලාවන්‍යශිල්පියා විසින් ප්‍රථමයෙන් සැලකිය යුතු වන්නේ

   a) ගාස්තුව අය කර ගැනීම
   b) ගනුදෙනුකරුගේ ආරක්ෂාව
   c) කාලය නිසි ලෙස යොදා ගැනීම
   d) ගනුදෙනුකරු විසින් දෙනු ලබන අමතර දීමනාව

5. පැතජනික් බැක්ටීරියා (Pathogenic Bacteria) පොදුවේ හඳුන් වන්නේ

   a) රෝගකාරක ක්ෂුද්‍රජීවීන් විනාශ කරන විශබීජ නාශකයක් ලෙසය.
   b) විෂබීජනාශකයක් ලෙසය.
   c) විෂබීජ හා ක්ෂුද්‍රජීවියක් ලෙසය.
   d) ප්‍රයෝජනවත් බැක්ටීරියාවක් ලෙසය.

6. රූපලාවන්‍ය ශිල්පියාට නැවත නැවතත් තම පාරිභෝගිකයන් රූපලාවන්‍යාගාරයට ගෙන්වා ගත හැක්කේ

   a) කලහකාරී වීම මගිනි
   b) සමීපබවක් ගොඩනගා ගැනීම මගිනි
   c) ඕපාදූප කථාකිරීම මගිනි
   d) පෞරුෂත්වය ස'වර්ධනය මගිනි

7. රූපලාවන්‍යාගාරය තුල සැපයුම් නිවැරදිව හා කාර්යක්ෂමව ලබාදීම සඳහා අවශ්‍යවන්නේ

   a) භාණ්ඩ ලේඛනයක් පවත්වා ගැනීමයි
   b) මිල කැඳවීම් පත්‍රිකාවයි
   c) වෙළඳාම් කිරීමට ඇති හැකියාවයි
   d) අගය පහත වැටීමේ සටහන පවත්වා ගැනීමයි

8. pH අගය 10ට පවතින මිශ්‍රණය වනුයේ

   a) ඇසිඩ් මිශ්‍රණයේය
   b) ලුණු කාරක මිශ්‍රණයේය
   c) ඔක්සයිඩ් මිශ්‍රණයේය
   d) ඇල්කොලයින් මිශ්‍රණයේය

9. රූපලාවන්‍යාගාරයක සනීපාරක්ෂාව පවත්වා ගැනීම සඳහා සැමවිටම

   a) රූපලාවන්‍යාගාරය හොඳ සුවඳවත්ව තැබිය යුතුය
   b) අතුරු ආබාධ ඇතිවීමට ඇති හැකියාව අඩුකර ගත යුතුය
   c) රූපලාවන්‍යශිල්පියා කාර්යබහුල විය යුතුය
   d) පාරිභෝගිකයන් පිළිගැනීමේ තත්වයන් උසස් කර ගත යුතුය.

10. ජීවානුහරණය කරන ලද කියුටිකල් නිපර් (Cuticle Nipper) එකක් ජීවානුහරණ තත්වයේ තබා ගැනීමට නම් වඩාත් සුදුසුම යොදා ගැනීම වන්නේ

a) ක්වෝටර්ලි ඇමෝනියම් (QUATS) දැමීමෙනි.
b) Auto Clave තුල තැබීමෙනි
c) UV Cabinet තුල තැබීමෙනි
d) Surgical Sprit දැමීමෙනි.

11. අනේවාචික සන්නිවේදනය (Non- verbal communication) සඳහා උදාහරණයක් වන්නේ

a) පැහැදිලි කිරීමයි
b) කථාබහ කිරීමයි
c) සාකච්ඡා කිරීමයි
d) නෙතුසබඳනා පැවැත්වීමයි

12. පුද්ගලික වර්ධනය යනු

a) පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම
b) යම්කිසි කෙනෙකු පවසන තුරු කාර්යයය කිරීමට බලා සිටීම
c) සොයාබලා වැඩෙහි යෙදීම
d) අවස්ථානුකූලව අළුත්දේවල් කිරීමට ඉගෙන ගැනීම

13. පුද්ගල සනීපාරක්ෂාව හොඳින් පවත්වා ගැනීම තුලින්

a) පෞද්ගලික සුබ සිද්ධිය ඇතිවේ
b) ප්‍රජාව තුල සුබ සිද්ධිය ඇතිවේ
c) නගරය තුල සුබ සිද්ධිය ඇතිවේ
d) සමාජය තුල සුබ සිද්ධිය ඇතිවේ

14. අඳුරු අවපැහැ සමක් මගින් පෙන්නුම් කරනුයේ

a) නීරෝගීකමයි
b) පෝෂ්‍යදායී ආහාර නොලැබීමයි
c) අවශ්‍ය ප්‍රමාණයට විවේකය නොලැබීමයි
d) දුර්වල සෞඛ්‍ය තත්වයයි

15. ශරීරය පිරිසිදුව තබාගත හැක්කේ සෑම විටම

a) Deodorant භාවිතය තුලින්
b) සබන් හා වතුර භාවිතයෙන්
c) විෂබීජනාශක භාවිතයෙන්
d) ලෙඩරෝග වලට බලපාන විෂබීජ නැසීමෙන්

16. හදවත, ධමනි හා ග්‍රන්ථීන් හානිවීමට බලපාන සාධකය වන්නේ

a) විවේකය
b) විනෝදයට කරන ක්‍රීඩා
c) ප්‍රබල හැඟීම්
d) බලාපොරොත්තු

17. සමේ ආරක්ෂාව සඳහා ඇති පිටත ස්ථරය හඳුන්වනු ලබන්නේ

a) චර්මය
b) මේද පටක
c) අපිචර්මය
d) ස්නේහස්‍රාවී පටක

18. රූපලාවන්‍යශිල්පියා විසින් නැවත නැවතත් ඕපාදූපයෙහි යෙදීම තුලින් පාරිභෝගිකයාගේ

a) අවධානය නැතිකර ගනී
b) ආකර්ෂනීය බව නැතිකර ගනී
c) විශ්වාසය නැතිකර ගනී
d) නිවැරදි ඉරියව් නැතිකර ගනී

19. පාද සම්බාහනයේදී පීඩනය යොදනු ලබන්නේ

a) දණහිසටය
b) වළලුකරටය
c) දණහිස සහ වළලුකර අතරටය
d) දණහිස සහ කලවා(Thigh) අතරටය

20. නියපොත්තේ නිදහස් අග්‍රය (Free Edge) පිරිසිදු කරනු ලබන්නේ

a) කූරෙහි උල්වූ කොටසිනි
b) Pusher හි උල්වූ කොටසිනි
c) දොඩම් කූරක ඔතන ලද පුළුන් මගිනි
d) ඕනෑම තියුණු උල්වූ උපකරණයක් මගිනි

21. රූපලාවන්‍යාගාරයකට පැමිණෙන දියවැඩියා රෝගියෙක් සඳහා දෙපා සත්කාර සිදු කිරීමේදී ආරක්ෂිත පියවරක් ලෙස නොකළයුතු කාර්යයක් වනුයේ

a) නියපොතු කැපීම
b) නේල් ෆයිල් (Nail file) කිරීම
c) කියුටිකල් (Cuticle) ඉවත් කිරීම
d) පියුමික් ස්ටෝන් (Pumice stone) භාවිතා කිරීම

22. වියලි සමක් සඳහා ප්‍රතිකාර කිරීමේදී රූපලාවන්‍ය ශිල්පියා විසින් පහත ද්‍රව්‍යයන් අතුරෙන් වැඩි ප්‍රතිශතයක් ඇති නිශ්පාදන භාවිතයෙන් වැලකිය යුතුද?

a) කෙසෙල්
b) වතුර
c) තෙල්
d) මධ්‍යසාර

23. සමේ සිදුරු විවෘත වන්නේ පහත සඳහන් කුමන දේ භාවිතා කිරීමෙන්ද?

a) සීතල තෙතමනය සහිත තුවා භාවිතයෙනි.
b) සීතළ වියළි තුවා භාවිතයෙනි.
c) උණුසුම් තෙතමනය සහිත තුවා භාවිතයෙනි.
d) උණුසුම් වියළි තුවා භාවිතයෙනි

24. රෝම ඉවත් කිරීමට යොදන රසායනික ද්‍රව්‍ය මඟින් ඒ අවට සම ආරක්ෂා කරනු ලබන්නේ,

a) ඇසිට්‍රිජන් ලොෂන්ය.(Astringent Lotion)
b) රබින් ඇල්කොහොල්ය.(Rubbing alcohol)
c) පෙට්‍රෝලියම් ජෙලි හෝ ක්‍රීම්ය.(Petroleum jelly or cream)
d) ප්‍රී ෂේවින් ලෝෂන්ය.(Pre – shaving lotion)

25. කට හා නිකට වටා ඇති අනවශ්‍ය රෝම ඉවත් කිරීමට සුදුසුම ක්‍රමය වන්නේ,

a) ට්වීසින් කිරීමය (Tweezing)
b) ක්ලිපින් කිරීමය (Clipping)
c) මතුපිටින් දැමීමය (Singeing)
d) ෂේව් කිරීමය (Shaving)

26. ට්විසරයක් මඟින් අනවශ්‍ය රෝම ඉවත් කිරීමේ දී, නිවැරදි දිශාව වනුයේ

a) රෝම වැවී ඇති දිශාවට විරුද්ධ දිශාවටය
b) රෝම වැවී ඇති දිශාවටය
c) කම්මුල දෙසටය
d) හිස් කබල දෙසටය

27. ඇහිබැම ට්වීසර් (tweezer) කිරීමෙන් පසුව ඇස්ට්‍රෝජන් ලෝෂන් (Astrogent Lotion) භාවිතා කරනු ලබන්නේ

    a) සම සැහැල්ලු කිරීමට
    b) සම හැකිලවීමට (සංකෝචනය වීමට)
    c) සම ප්‍රසාරණය කිරීමට
    d) සම උද්දීපනය කිරීමට

28. දුරස්ව පිහිටා ඇති ඇස් වල දුරස්බව අඩුකර පෙන්වීම සදහා සුදුසු ක්‍රමය වන්නේ

    a) ඇහිබැම දෙපස අඩුකර කෙලින් සැකසීමය
    b) අසෙහි දෙකෙළවර තෙක්  දෙපස  ඇති ඇහි බැම දික් කිරීමය
    c) ඇහි බැම  කෙළින්ම ඇදීමෙනි
    d) ඇහි බැම  කෙළවර තෙක් වක්‍රාකාරව ඇදීමෙනි

29. ලංව පිහිටා ඇති ඇස් ඈත් කර පෙන්විය හැක්කේ ඇහි බැම හා ඇස් අතර ඇති ඉඩ ප්‍රමාණය ,

    a) ඒ අතර ඇති දුර ප්‍රමාණයට වඩා වැඩි කිරීමෙනි
    b) ඒ අතර ඇති දුර ප්‍රමාණය වඩා කෙටි  කිරීමෙනි
    c) ඇස් අග තෙක් ඇහි බැම කෙටි කිරීමෙනි
    d) ඇස් දෙකෙළවරින් එහා තෙක් ඇහි බැම දික් කිරීමෙනි

30. ඇහි බැම වක් හැඩයට සැකසීමේ  දී ඇති වන ආසාදනය වැළැක්වීමට කළ යුත්තේ ,

    a) විෂ බීජ නාශයක් භාවිතය
    b) ලෙඩ රෝග වලට බලපාන විෂබීජ නැසීම
    c) ඩියෝඩරන්ට් එකක් භාවිතය
    d) පවුඩර් එකක් භාවිතය

## B කොටස

**මෙම ප්‍රශ්ණ පත්‍රයෙහිම පිළිතුරු ලියන්න**

**(එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගිනි)**

1. **මෙනිකියු** කරන අතරතුරදී අවශ්‍ය උපකරණ තැබිය යුත්තේ කොහේද?

2. ඇඟිලිවල ස්වභාවික පෙනුමක් ගෙන ඒම සඳහා නිය සැකදාය යුතු හැඩතලය කුමක්ද?

3. පාදයේ ඇඟිලි අතර දියර බිබිලි ඇතිවීම සහ සම රළු සහ සුදු පැහැතිවීමට හේතුව වන රෝගී තත්තවය කුමක්ද?

4. ඇඟිලි බ්ලීචින් (bleaching) කිරීම සඳහා යොදා ගන්නා ක්‍රියාකාරකය (agent) කුමක්ද?

5. නැවත නැවත වියළී ඉවත්වන ස්ථරය කුමක්ද?

6. වියලි සමක් සඳහා භාවිතා <u>නොකල</u> යුත්තේ කුමන ද්‍රව්‍යය විශාල වශයෙන් අඩංගු ක්‍රීම්ද?

7. අයිබ්‍රෝ එකක් ට්විසර් කිරීමේ නිවැරදි දිශාව කුමක්ද ?

8. කෘතීම නියපොතු භාවිතයේ ප්‍රයෝජනයක් ලියන්න.

9. සේවාදායකයාගේ මුහුණට ප්‍රතිකාර කිරීම සඳහා පැමිණි විට ඔහු/ඇය බලාපොරොත්තු වන වැදගත් අවශ්‍යතායව කුමක්ද?

10. රූපලාවන්‍යාගාරයක පරිසරයේ තිබිය යුතු ආරක්ෂිත තත්වයන් 02 ක් ලියන්න.
    I.

    II.

11. රූපලාවන්‍ය කාර්යයන් සඳහා රසායනික ද්‍රව්‍යයන් භාවිතා කිරීමේදී සැලකිය යුතු ප්‍රධාන කරුණු 04ක් ලියන්න.

**ලකුණු 04)**

i.

ii.

iii.

iv.

**(**

12. සේවාදායක උපදෙස් පත්‍රිකාවක අඩංගු විය යුතු තොරතුරු 05 ක් ලියන්න.

i. **(ලකුණු 05)**

ii.

iii.

iv.

v.

13. සමෙහි හරස්කඩක් ඇඳ නම් කරන්න.

**(ලකුණු 08)**

14. නියපොත්තෙහි හරස්කඩක් ඇඳ නම් කරන්න. **(ලකුණු 08)**

## C කොටස

**වම්පස ඇති විස්තරයට ගැලපෙන ප්‍රතිචාරය තෝරා එයට අදාළ ඉංග්‍රීසි අකුර විස්තරයට ඉදිරිනේ ඇති අදාළ කොටුවෙහි ලියන්න.**

| විස්තරය | | ප්‍රතිචාරය |
|---|---|---|
| 1. ඕවර් ඇක්ටිව් (Over active) සෙබේසස් ග්‍රන්ථි වලින් ස්‍රාවය කෙරෙනුයේ | ☐ | a. ඕවලාකාර |
| 2. බිත්තර face pack භාවිතා කරන්නේ , සිදුරු (pores) පිරිසිදු කිරීමට මෙන්ම | ☐ | b. සරල ධාරාව |
| 3. Corrective සමක් මේක් අප් කිරීමේදී බලාපොරොත්තු වන්නේ මුහුණට හැඩයක් දීම | ☐ | c. රින්කල්ස් (wrinkles) |
| 4. මූලික මේක් අප් කිරීම මඟින් නැති කර ගත හැක්කේ | ☐ | d. සමෙහි තද බවක් ඇති කිරීමට |
| 5. ඇස් බැම ඉදිරියේ ඇති කෙස් ස්වල්පය ඉවත් කිරීමට භාවිතා කරනුයේ | ☐ | e. පළපුරුදු නොමැති කමිනි. |
| 6. රසායනික ද්‍රව්‍යයන් (depilatory) භාවිතයට පෙර කළ යුතු වන්නේ | ☐ | f. ට්වීසර් (tweezer) |
| 7. එක් දිසාවකට ගලා යන විදුලි ධාරාව හඳුන්වනු ලබන්නේ | ☐ | g. සාර්ථක නොවේ |
| 8. ජේෂල් සහ ස්කල්ප් ස්ටීමරය භාවිතා කරනු ලබන්නේ | ☐ | h. තෙතමනය ඒකාකාරී උෂ්ණත්වයේ තබා ගැනීමට |
| 9. ව්‍යාපාරය නොසලකා හැරීම හා ගිණුම් නිසියාකාරව පවත්වා නොගැනීමෙන් තම සැලූනය | ☐ | i. සාර්ථකවේ |
| 10. රූපලාවන්‍යාගාරවල කළමණාකාරිත්වය දුර්වලවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වනුයේ | ☐ | j. සමෙහි මෘදු බවක් ඇති කිරීමට |
| | | k. සම පරීක්ෂාව |
| | | l. සීබම් (Sebum) |

**(ලකුණු 10)**